# ඝාතකයා ආ හැටි ඇසින් දුටුවෙක්



මේජර් ජෙනරාල්
ජානක පෙරේරා මහතා

" රැස්වීම අවසන්වී කැවුම් කිරිබත් කෑමට සූදානම් වුණා. එතකොටම කොට කලිසමක් ඇඳගත් පුද්ගලයකු වේගයෙන් ඇතුළට දිව්වා. ජානක පෙරේරා මහතා සිටි තැනදී කමිසය දෙපැත්තට ඉරා යමක් තද කළා. එවිට ලොකු පිපිරුමක් ඇසුණා. ජානක මහත්තයි තව අයයි කෑලි වලට කැඩී වැටුණා....."

එසේ පැවසුයේ අනුරාධපුර පැරණි නගරයේ එක්සත් ජාතික පක්ෂ කාර්යාලය බිමේ දී මරාගෙන මැරෙන බෝම්බය පිපිරී ගිය හැටි කෝලිබැන්ද වැව මොහොමඩ් සුබයිදීන් මහතාය. ඔහු මෙසේද කීය.

" ස්තුති කතාව කෙළේ ජානක පෙරේරා මහතයාගේ නෝනා. දොස්තර ජෝන්පුල්ලේ මහත්තයයි නෝනයි අත්දෙක අල්ලාගෙන වගේ මැරී හිටියා...."

සුබයදීන් මහතා එහි මිදුලේ සිටියදී බෝම්බකරු ඔහු ද තල්ලුකරගෙන ශාලාව තුළට දිවූ බව ද පැවැසේ.

# මන්ත්‍රීවරයෙකු ලෙස කරුණා දිව්රුම්දෙයි!



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා කරුණා අම්මාන්ට ජනපති මැඳුරේදි ආචාර කළ අයුරු

අමු කොටි ත්‍රස්තවාදියෙකු ලෙස මේ මැතක් වනතුරු තුවක්කු අත දරා කරේ සයනයිඩ් කරලක් බැඳගෙන, මඩකළපු ප්‍රදේශ භාරව සිටියාවූත්, ප්‍රභාකරන්ගේ ඊළම් සගයාව සිටියාවූත්, කරුණා හෙවත්, කරුණා අම්මාන් හෙවත්, විනයාගමූර්ති මුරලිදරන් දැන් ත්‍රස්තවාදයෙන් ඉවත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිගෙන ඇතැයි කියන බැවින් ඔහු පත්කළ මන්ත්‍රී වරයෙකු ලෙස පෙරේදා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී දිව්රුම් දුන්නේ ය.

එහිදී කළ කතාවේදී කරුණා කියාසිටියේ පසු ගිය කාලයේ සිදුවූ දේවල් අමතකකොට රටේ යහපතට තමා වැඩ කරන බවත් මහින්ද චින්තනය පිළිගන්නා බවත් ය. එමගින් උතුරු නැගෙනහිර දෙමළ ජනතාවට විශාල සේවයක් තමාට කළ හැකි බව ද කීවේ ය.

එහෙත් කරුණා මෙලෙස මන්ත්‍රීවරයෙකු ලෙස පත්කිරීම ගැන ශ්‍රීලංකාවේ බොහෝ දෙනා තුළ දැඩි අප්‍රසාදයක් ඇති බව පෙනේ. ත්‍රස්තවාදය ළඟදී අත්හැරිය බව කියතත් අපරාධකාරයෙකු වන ඔහු පාර්ලිමේන්තුවට වැද්ද ගැනීම කිසිසේත් කළයුතු නැති බවත්, හරි නම් ඔහු අත්අඩංගුවට ගෙන ඔහුට එරෙහිව නීති මගින් ක්‍රියාකොට ඔහු කර ඇති අපරාධවලට දඬුවම් පැමිණවිය යුතු බවත්ය. ජනතා විමුක්ති පෙරමුණ මේ පිළිබඳව නඩුවක් පැවරීමට සූදානම්වේ.

## OBITUARY අවමංගල්‍ය

### H. MAHES DE SILVA මහේෂ් ද සිල්වා



Mahes De Silva (**HM**) - formerly Chief Engineer, Associated Motorways Ltd. - passed away suddenly at St Helier Hospital, Carshalton, Surrey on 20 September 2008, aged 69. The funeral took place at the North East Surrey Crematorium on 27 September 2008,. He is survived by his beloved wife, Florence.

Mahes was the second son of late W. Barnes and Alice De Silva (nee Wijesurendra) of Mount Lavinia. He was the brother of late Hubert (Prasanna), Lakshmi, Malini, Kirthi, Gemunu, Sarojini, Wijaya and late Neville, and brother-in-law of Shirley, late Anton Gomes, late Richard De Silva, Beatrice, Dhammika, Kirthi Meewewa, Radha and Maureen. He was also brother- in-law of Mrs Girlie Tyler, late Mrs Felicia Jayawardena, late Mrs Annette Lansakara, late Ms Rita De Silva, Mrs Winifred Ratwatte, Stanley De Silva, Mrs Monica Malalasekera, Mrs Bridget Wahalatantri and Mrs Therese Tissera.

A staunch Buddhist, and an Old Thomian, Mahesh emigrated to the UK in 1962. He was an qualified automotive engineer with a deep passion for motor vehicles. Mahes was a very kind and generous man of remarkable character possessing often a sense of humour enjoyed and loved by all those who knew him.

**MAY HE ATTAIN NIBBANA!**

**34B Oliver Road, Sutton SM1 4QF. Tel: 020 8770 7920**

# ශ්‍රීලංකා රජය ගංජා වැවීමට අදහස්කරයි

ශ්‍රීලංකා රජය තමන්ගේම ගංජා වගාවක් ඇති කිරීමට සූදානමින් සිටින බව රොයිටර් පුවතක සඳහන් වේ. දැනට ශ්‍රීලංකාවේ ආයුර්වේද සංස්ථාවේ නිශ්පාදනය කරනු ලබන සමහර බෙහෙත් වර්ග සඳහා ගංජා අවශ්‍යව ඇති බැවින් පවතින ගංජා හිඟයට පිළියමක් ලෙස තමන්ගේම ගංජා වගා ව්‍යාපාරයක් ඇතිකිරීමට මෙසේ රජය ලැස්ති වන බව කියති. ශ්‍රීලංකාවේ ගංජා වැවීම වර්ෂ 1890 සිට මේ දක්වා තහනම් වූ දෙයකි.

දේශීය ඖෂධ සංස්ථාව දැනටමත් අක්කර 20 ක බිම් ප්‍රමාණයක් ඒ සඳහා තෝරාගෙන ඇත. එහි වසරකට ගංජා කිලෝ 4000 ක් ලබාගැනීමට හැකි වගාවක් ඇතිකිරීමට බලාපොරොත්තුවේ.

" අපි මේ බලාගෙන ඉන්නෙ රජයේ අනුග්‍රහය හා අනුමැතිය ඇතිව එහෙත් ක්‍රමවත් පාලනයක් ඇතිව ගංජා වැවීමටයි. තවමත් ඒ ගැන අවසාන නිගමනයකට ඇවිත් නෑ. තවම ඒ සඳහා කටයුතු පිළියෙල කරගෙන යනවා."

එසේ පවසන්නේ ඖෂධ සංස්ථාව වෙනුවෙන් කතා කළ එහි ලේකම් අසෝක මාළිමගේ ය.

ගංජා ගිතෙලින් බැද රෝග ගණනාවකටම ප්‍රතිකාර වශයෙන් ආයුර්වේදයේ යොදා ගෙන ඇති බව දේශීය වෛද්‍යවරු කියති. දැනට ආයුර්වේදී බෙහෙත් මිශ්‍රණවලට අවශ්‍ය ගංජා ලබාගන්නේ නිති විරෝධී ලෙස ගංජාතොග අල්ලා ගත්විට ඒවා උසාවියට ඉදිරිපත් කිරීමෙන් පසු විනාශ කිරීම සඳහා පොලීසියට භාර දෙන ගංජා තොගවලින් ඉල්ලා ගැනීමෙනි. එහෙත් ඒවා වියලි ඒවා බැවින් එහි ගුණය අඩු බවත් බෙහෙත් වලට අවශ්‍ය ගංජා ඉස්ම ගත හැක්කේ අමු ප්‍රාණවත් ගංජා කොළ වලින් පමණක් බවත් සංස්ථාව පවසයි.

ඖෂධ සංස්ථාව කියන අන්දමට දියවැඩියාව. කොලොස්ටොරෝල්. ආතරයිටීස් යනුවෙන් හඳුන්වන විවිධ හන්දිපත් කැක්කුම්, මේ ආදී රෝගාබාධ ගණනාවකටම සාදන බෙහෙත් සඳහා ගංජා අවශ්‍ය වී ඇත.

ඇමරිකාව ඇතුළු සමහර රටවල ඇතැම් රෝගවල වේදනාව අඩුකර ගැන්මේ මහක් ලෙස රෝගීන්ට ගංජා භාවිතයට ඉඩ දී තිබේ.

## ♥ පැටියෝ ඩාලිං



" පැටියෝ මෙන්න පුදුම වැඩක්.... අපේ රජය එපයි කියද්දි බ්‍රිතාන්‍ය රජයෙන් කිලිනොච්චියට බලෙන් ආධාර යවන්න හදනවා."

" හා... ඒ හදන්නෙ පණ අදින කොටින්ට ආයුධයි අහස්යාත්‍රා කෑලියි ගිහින් දෙන්න. අපේ ආණ්ඩුවත් ඒ ගැටේට අහුවෙයිද?" න

# Sinhala Lesson 126 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### The Past Participles අතීත කෘදන්ත ක්‍රියා

In English most verbs use the same verb form for both the **Past Tense** and the **Past Participle**, such as played, looked, danced, used, walked etc. Some verbs have different verb forms such as did and done, ate and eaten, swam and swum, grew and grown, gave and given etc. In Sinhala most verbs take different verb forms for the Past Tense and the Past Participle. The Sinhala Past Participle is expressed in different words as seen below:

| **Base of Verb** | **Past Partciple** | |
|---|---|---|
| කිය (to say) | කී/කිව්/කිව්ව/කියූ/කියනලද/කියපු | = said |
| ක (to eat) | කෑ/කෑව/කාපු/කනලද | = eaten |
| බල (to see) | බැලූ/බැලූව/බලපු/බලනලද | = seen |
| කර (to do) | කරපු / කළ / කරනලද | = done |
| උය (to cook) | උයපු/උයනලද/ඉව්/ඉව්ව/ඉවූ | = cooked |
| සිත (to think ) | සිතූ/සිතූව/සිතපු/සිතනලද | = thought |

Here the verb is used as Adjective and Adjectival clause

කිව් කතාව = the related story/the story which was related
කළ වැඩ = the work done / the work that was done
උයපු කෑම = the cooked food / food that was cooked
සිතූ අදහස = the thought idea/the idea which was thought

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

## හරස්පද ප්‍රහේලිකා 103

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | ■ | 3 | |
| 4 | | 5 | | ■ |
| 6 | | | | ■ |
| 7 | | ■ | 8 | 9 |
| | ■ | 10 | | |

**හරහට :**
1 ස්වකීය
3 බඩු ප්‍රවාහනයට උදව් වේ
4 බැඳුම් අතර රසවත්ම බැඳුම
6 ලෝහ තහඩු විශේෂයකි
7 වීණාවේ මෙය ඇත
8 අහසේ පිපෙන මල්
10 පසුවුණු දවස

**පහළට :**
1 හරියටම ගැලපීම
2 මැණික් අතර අතිශය වටිනාකමින් යුත් මැණික
3 සිහිමූර්ඡා වීම 5 එන්න යයි කෝපයෙන් අඩගැසීම
9 ඇඟේ පතේ කැක්කුම්

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට:** 1 මකරා 4 හර 5 පය 6 පාත්තරය 8 රතවාහන 9 නට
**පහළට:** 1 මහපාර 2 කරත්ත 3 මියයන 5 පරහට 7 තවාන

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

### වැටකොලු සලාදය

*වැටකොළු දියර එළෝළුවකි. එය ලෙඩුන්ට සුදුසු ලෙඩ එළෝළුවක් ලෙස ද සලකති. ගමේ කොරටුවල හැදෙන වැටකොළු රසවත් ව්‍යංජනයකි. මේ වැටකොළු වලින් රසවත් සලාදයක් සාදා ගන්නා හැටි ය.*

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| මෝරපු නැති වැටකොලු | ග්‍රෑම් 500 යි |
| රතුළූනු | ග්‍රෑම් 200 යි |
| අමු මිරිස් කරල් | 4 යි |
| උම්බලකඩ | ග්‍රෑම් 5 යි |
| තක්කාලි ගෙඩි | 3 යි |
| ගම්මිරිස් කුඩු හා ලුණු කුඩු | ස්වල්පයක් |
| දෙහි යුෂ ස්වල්පයක් | |

***සාදන ක්‍රමය :*** වැටකොලුවල ලෙල්ල රැස, සෝදා තුනියට පෙති කපන්න. එණු සුද්දකර කපා ගන්න. අමු මිරිස් පලා සිහිනියට කපාගන්න.

බඳුනක් ගෙන කැපූ වැටකොලු පෙති එයට දමා ලුණු ස්වල්පයක් එකතු කරන්න. හොඳින් අතින් කළවම් කර වැටකොලු පෙති යාන්තමට මිරිකා ගන්න.

තවත් බඳුනකට අර කලින් ලියාගත් එණු, අමුමිරිස් දමා ඊට උම්බලකඩ කුඩු, ගම්මිරිස් කුඩු හා ලුණු ස්වල්පයක් ද එකතුකර හොඳින් පොඩිකරගන්න. දැන් මුලින් පිළියෙල කරගත් වැටකොලු පෙති ඊට එකතුකර මිශ්‍ර කරන්න. තක්කාලි සිහින් තීරුවලට කපා ඊට දමා කළවම් කරන්න. රස අනුව දෙහි ස්වල්පයක් එක් කරන්න. කළවම් කිරීමේ දී තක්කාලි පොඩි නොවන්නට වග බලා ගන්න. දැන් වැටකොලු සලාදය මේසයට යවන්න.

♦ ***පුෂ්පා රණවීර*** Sri Lanka

Sam's
CHICKEN
CHICKEN
CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432